ආගරපතන ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ආගරපතන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (I) | ස්ථාවර වත්කම් ශේෂය සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය අතර රු.1,138,325 ක වෙනසක් තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ . | පිළිතුරු ලැබී නොතිබුණි. |
| (II) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.577,041 ක් වුවද එය රු.158,625 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම හා වර්ෂය අවසානයට ණයගැති ශේෂය රු.418,416 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| (III) | සභාව සතු ත්‍රීරෝද රථයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් ගත කිරිමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| (IV) | කර්මාන්ත 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.1,736,619 ක මුදලක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි | නිවැරදිව ගිණුම් ගත කිරිමට කටයුතු කළ යුතුවේ | පිළිතුරු ලැබී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (V) | සමාලෝචිත වර්ෂය තුළ සේවක ණය අයවීම රු.362,200 ක් ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරිමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| (VI) | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යංශ ආධාර යටතේ ක්‍රියාත්මක කර තිබුණු කර්මාන්ත 02 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම හා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.626,908 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරිමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

(ආ) නොසැසඳුනු ගිණුම්
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 02 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.157,047 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම
---------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම
-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.9,981,646 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් අදාළ හිමිකම් ඔප්පු / පැවරුම් නියෝග, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ශේෂ උපලේඛන සහ යාවත්කාලීන කළ ලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | ශේෂ තහවුරු කිරිමට අදාල සාක්ෂි ඉදිරිපත් කළයුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

1.4 අනුකූල නොවීම්

නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසි වලට අනුකූලව නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | පරිසර බලපත්‍රවල වලංගු කාලය ඉකුත්ව තිබුණ ව්‍යාපාර 31 ක් සඳහා නව බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම නව සභාව පිහිටුවීමෙන් පසු බලප්‍රදේශය තුළ පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හඳුනාගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදාළ නීති සහ රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| (ආ) | <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| | රීති 141 | පී.එස්.39 ආකෘති පත්‍රය ප්‍රකාරව තැන්පතු ලේඛනයක් පවත්වා නොතිබුණි. | රීති උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| | රීති 217 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි පීඑස් 46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක සටහන් කර නොතිබුණි. | (මූල්‍ය සහ පරිපාලන) රීති උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| | රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | (මූල්‍ය සහ පරිපාලන) රීති උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු සපයා නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 සහ ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 22 වන අතිරේකය | ලියාපදිංචි සමිති වෙත කොන්ත්‍රාත් පැවරීමේදී අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පත් කල නිළධාරීන් දෙදෙනෙකුගෙන් යුතු කමිටුවක නිර්දේශයකින් තොරව අනුමත සමිති 02 ක් වෙත කොන්ත්‍රාත් පවරා තිබුණි. | අදාළ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.4,965,288 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

(අ) ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

2018 අප්‍රේල් 01 දින ස්ථාපිත කර තිබූ සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවයක කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,036,075 | 1,203,694 | 1,210,963 | 750,350 |
| කුලී | 90,000 | 25,545 | 22,840 | 14,782 |
| බලපත්‍ර ගාස්තු | 1,280,000 | 1,106,560 | 1,106,560 | - |
| වෙනත් ආදායම් | 5,531,600 | 992,044 | 782,588 | 719,088 |
| | 7,937,675 | 3,327,843 | 3,122,951 | 1,484,220 |

2.2.1 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට පැවති රු.803,262 ක් වූ වරිපනම් බදු හිඟයෙන් වර්ෂය තුළ අයකිරීම රු.123,364 ක් විය. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර හිඟ ආදායම් අයකරගත යුතුවේ. | පිළිතුරු ලැබීනොතිබුණි. |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.158,625 ක උසාවි දඩ හා රු.80,000 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට හෝ 1988 අගෝස්තු 23 දිනැති අංක 520 / 7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පතකරන ලද පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

(ආ) ක්‍රියාකා සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාළව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | කාල පරිච්ඡේදයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

(ඈ) අතහැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නෝනාවත්ත නගරයේ පොදු වැසිකිළියක් ඉදිකිරීම සඳහා 2018 ඔක්තෝබර් මස ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.138,517 ක් ගෙවා තිබුණද 2019 මැයි මස වන විටද කර්මාන්තයෙ ආරම්භක නොතිබුණු අතර අත්තිකාරම් මුදලද පියවාගෙන නොතිබුණි. | ව්‍යාපෘති අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

(ඈ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| i. ආගරපතන පොදු වැසිකිළියේ අපද්‍රව්‍ය රැගෙන යන නල, පූතික වලකට යොමු නොකර පරිසරයට විවෘතව තිබුණි. | විධිමත්ව අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |
| ii. ඩයගම පොදු වැසිකිළියේ අපද්‍රව්‍ය එක්රැස්වන පූතික වල තුළින් අපද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීමේ ක්‍රමවේදයන් සකසා නොතිබුණි. | විධිමත්ව අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලසුම් සකස් කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 19 ක පැවති පුරප්පාඩු 81 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි |

3.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව වෙත පවරා දී තිබූ වාහන 02ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද සභාව නමට ලියාපදිංචි කරවාගෙන නොතිබුණි. | අදාළ වාහන සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි |

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බැල්මොරල් කොටස අඩිපාර ඉදිකිරීමේ කර්මාන්තයේ කොන්ක්‍රීට් යෙදීම සඳහා ගෙවීම් කිරීමේදී රු.26,792 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1. අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

4.2. අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |

4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත කාල පර්ච්ඡේදය තුළ විගණන හා කළමනාකරණ කමිටුව එක් වරක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | පිළිතුරු ලැබී නොතිබුණි. |